**ශීර්ෂය - 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජූලි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 28 දිනට හෝ ඊට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් 2023 පෙබරවාරි 27 දින ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල පැවති ප්‍රමාණාත්මක දෝෂ හේතුවෙන් ඒවා ඉවත් කරගෙන සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2023 මැයි 24 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ප්‍රමාද කාලය මාස 02 දින 24 ක් විය. | අදාළ මූල්‍ය ප්‍රකාශන නියමිත පරිදි 2023 පෙබරවාරි 27 දින විගණනය සඳහා ඉදිරිපත් කරනු ලැබුව ද, 2023 අප්‍රේල් 03 දිනැති විගණන විමසුමෙන් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා 2023 අප්‍රේල් 19 දින මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගෙන ඇති බව. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කර නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ සමඟ සැසඳීමේදී තැන්පතු ගෙවීම් හා මුළු ශුද්ධ වියදමෙහි රු.24,522 ක් බැගින් වෙනස්කම් නිරීක්ෂණය වූ අතර එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ද ගලපා නොතිබුණි. | මහා භාණ්ඩාගාරය දැනුවත්කොට නිවැරදි කිරීමට කටයුතු කරන බව. | දෙපාර්තමේන්තුවට අදාළ වන වියදම් නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය වෙනස්කම් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ගැලපීම් කිරීමට කටයුතු යුතුය. |

### (ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසාන ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,992,636 ක ණය ශේෂයක් හිඟහිටව තිබුණු අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයකට අයත් ණය ශේෂය රු.906,516 ක් ද, වසර 01 ත් 05 ත් අතර කාලයට අයත් ණය ශේෂය රු.924,805 ක් ද විය. | හිඟ හිටි ණය ශේෂ සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරමින් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. | තවදුරටත් අයවිය යුතුව ඇති ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 104(3) සහ (4) | වාහන අනතුරු සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, 2019 වර්ෂයේ අනතුරට ලක් වූ දකුණු කලාප කාර්යාලයට අයත් ලුණුගම්වෙහෙර උද්‍යාන පිවිසුම් කාර්යාලයේ වාහනයක පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. | 2020.07.15 වන දින ලැබී ඇති මෙම අනතුර සම්බන්ධ මු.රෙ.104(4) අවසන් වාර්තාවෙහි අඩුපාඩු කිහිපයක් පිළිබඳව නැවත තොරතුරු කැඳවා ඇති අතර එය ලද පසු මු.රෙ.104(4) පරීක්ෂණය අවසන් කළ හැකිය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 395(ඇ) හා (ඊ) සහ 2017 දෙසැම්බර් 28 දිනැති අංක 04/2017 දරන අභ්‍යන්තර චක්‍රලේඛය | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් එළඹෙන මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කළ යුතු නමුත් දකුණු පළාත් කළාප කාර්යාලයේ 2022 වර්ෂයේ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම මාස 04 කට අධික කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණි. | ප්‍රමාදයන් වලක්වා ගෙන බැංකු සැසඳුම් වාර්තා යොමු කිරීම සඳහා මේ වන විට කටයුතු සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශ විධිමත් පරිදි පිළියෙල කර නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 31 වන ඡේදය | දෙපාර්තමේන්තුවේ බහුතරයක් වාහන සඳහා නියමිත ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතුය. |
| (ඇ) | 2020 ඔක්තෝම්බර් මස 02 වන දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) ඡේදය | ධාවන තත්ත්වයේ නොපවතින හා අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන 2020 දෙසැම්බර් මස 31 දිනට පෙර අපහරණය සිදුකළ යුතු වුවත් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ භාවිතයෙන් ඉවත් කර ඇති දකුණු කළාප කාර්යාලයට අයත් යතුරු පැදි 05 ක් සහ අලි ලොරි රථයක් එසේ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට සුදුසු වාහන හඳුනාගැනීමේ විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) ගේ සභාපතිත්වයෙන් යුතුව පත් කර අපහරණ කටයුතු ආරම්භ කර ඇත. | ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති - පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය ව්‍යාපෘතිය (ESCAMP)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු.මිලියන 0.72 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ පවුල් ඒකක 105 ක ජීවන තත්ත්වය නඟා සිටුවීමේ ක්‍රියාකාරකම් 05 ක් අත්හැර දමා තිබුණු අතර රු.මිලියන 232.93 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් | රට තුළ පැවති ආර්ථික අර්බුදය හා කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. බුලත් වගාකිරීමේ පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ සිටුවන ලද පැලවලට වැළඳුනු රෝගයක් හේතුවෙන් මෙම බුලත් පැල කුඩා කාලයේ දීම විනාශ වී ඇති අතර රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ | විදේශාධාර ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන කාර්යයන් ඒ ආකාරයට සම්පූර්ණ කර ඵලදායී ලෙස ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ තවත් කාර්යයන් 09 ක් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද, උඩවලව ජාතික උද්‍යානය හරහා එක් පවුලක් සඳහා පර්චස් 80 ක බුලත් වගා කිරීමට පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ රු.මිලියන 0.770 ක් වැය කර පවුල් ඒකක 14 ක් වෙත ලබා දී තිබුණු බුලත් පැළ රෝගයකට ගොදුරු වී අස්වැන්න ලබා ගැනීමට ප්‍රථම විනාශ වී තිබුණි. | ආනයන සීමා පැනවීමත් සමග පොහොර වර්ග, රසායනික බෙහෙත් වර්ග රට තුළ හිඟවීම හේතුවෙන් මෙම පැලවලට නිසි කලට අවශ්‍ය සත්කාර කිරීමට ද නොහැකි වී ඇත. | |
| (ආ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් වීමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්, කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ මෙහෙයුම් මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108 කට අදාළ | නිලධාරීන්ගේ රාජකාරියේ ස්වභාවය අනුව ක්ෂේත්‍ර අධ්‍යයන් කටයුතු රට පුරා පැතිරී පිහිටි විවිධ රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව සිදු කළ යුතුව තිබූ බැවින්, අධික වියදමක් දැරීමට සිදුවීම හේතුවෙන් ද, නේවාසික පුහුණු ගිරිතලේ පුහුණු කේන්ද්‍රයෙන් බැහැරව කිරීමට සිදු වූ බැවින් ද එක් නිලධාරියකු වෙනුවෙන් සිදු කරන ලද මූල්‍යමය යෙදවුම ඉහළ අගයක පැවතුණි. මෙම තත්ත්වයන් ඇති වූයේ කොවිඩ් උවදුර උච්ඡව පවත්නා කාලය තුල බැවින් ආයතන දෙක සමඟ ඇති කර ගත් එකඟතාවය සහ අනෝන්‍ය අවබෝධය මත ESCAMP ව්‍යාපෘතිය ද දැනුවත් කර අදාළ ගෙවීම සිදු කරන ලදී. | විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරන මෙවැනි කාර්යයන් අරපිරිමැසුම්දායීව සහ ඵලදායී ආකාරයට සිදු කළ යුතුය. |

ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැසුම්දායි ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය.

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොන්ත්‍රාත් වියදම රු.1,752,100 ක් වූ දෙමෝදර ආයකපොල්ල හා ආනපල්ලම හඳපානාගල අලි අගල ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රසම්පාදන කාර්යයේදී ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා නොගෙන, තාක්ෂණික ඇගයීමකින් ද තොරව ලිඛිත ගිවිසුමක් රහිතව අදාළ කාර්යය පවරා තිබීමෙන් එය 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලට අනුකූල නොවූවක් බවට නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම් ඇතුළු කමිටුව විසින් නම් කරන ලද දෙහිලන්දයාය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ප්‍රසම්පාදන අනුමැතිය ලබා ගෙන ගිවිසුම් අත්සන් කොට අදාළ කොන්ත්‍රාත්තු ඉටු කිරීම සඳහා භාර දී ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) ආනපල්ලම හඳපානාගල අලි අගලේ දෙවන අදියර ලෙස කිලෝමීටර් 1.5 ක් කැපීම සඳහා ප්‍රාදේශීය ලේකම් වැල්ලවාය විසින් දෙහිලන්දයාය සමිතිය තෝරාගෙන තිබුණ ද, කමිටුවේ අනුමැතිය ලැබීමට දින 02 කට පෙර කොන්ත්‍රාත් වටිනාකම රු.1,587,217 කට දෙපාර්තමේන්තුව එම සමිතිය සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. | කොන්ත්‍රාත්තුව කඩිනමින් ඉටු කිරීම අවශ්‍ය වූ බැවින් අදාළ කමිටුවේ ලිඛිත නිර්දේශය තැපැල් මාර්ගයෙන් ලබා ගැනීමට පෙර අදාළ කමිටුවේ වාචික අනුමැතිය මත අදාළ සමිතිය සමඟ ගිවිසුම්ගත වී ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව පූර්ව අනුමැතිය මත කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ GIZ ව්‍යාපෘතියෙන් ලබා දී තිබුණු රු.20,755,328 ක් වටිනා වත්කම් දෙපාර්තමේන්තු ගබඩාවෙහි වට්ටෝරු පොතට ඇතුළත් කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පෙර වර්ෂයන්හි විගණන වාර්තා මඟින් කරුණු පෙන්වා දෙනු ලැබුව ද ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පත් කළ කමිටුවෙහි නිර්දේශ අනුව ව්‍යාපෘතිය මඟින් ලබාදුන් බවට ලේඛන පවතින නමුත් භාරගත් බවට දෙපාර්තමේන්තු වට්ටෝරු පොත්වල වාර්තා කර නොමැති අයිතම සම්බන්ධයෙන් භෞතිකව පරීක්ෂා කර බලා අදාළ ලේඛන වලට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම භාණ්ඩ බඩු ලේඛන පොත්වල සටහන් කළ යුතු අතර විගණන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුතුරාජවෙල පරිසර පද්ධතියේ හෙක්ටයාර් 1,285 ක බිම් කොටසක් 1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මඟින් අභය භූමියක් ලෙස ගැසට් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභය භූමියේ මායිම් ලකුණු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | අදාළ ප්‍රාදේශයේ කොටසක මායිම් සලකුණු කර ඇති අතර 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මුතුරාජවෙල අභයභූමියේ මායිම් කණු සිටුවීමට අදාළව ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් අදාළ ආයතන සමඟ සාකච්ඡා පවත්වා පොලිසියේද සහාය ඇතුව සංවේදී කලාපයන්හි මිනුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | මායිම් නිශ්චිතව ළකුණු කර අභයභූමිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) දකුණු කලාප කාර්යාලය විසින් 2022 වර්ෂය තුළදී මාර්ග දෙපස යටි කැළය ඉවත් කිරීම සඳහා වූ එකතුව රු.5,337,814 ක ප්‍රසම්පාදන කාර්යන් 04 ක් 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් පරීක්ෂා නොකර ප්‍රජා පාදක සංවිධාන 03 කට පවරා තිබුණු අතර ඊට අදාළ ගිවිසුම්වලට ද දෙපාර්තමේන්තුව විසින් අත්සන් | ඉදිරියේදී එවැනි ප්‍රමාද දෝෂයන් සිදු නොවීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන ලිඛිත ගිවිසුම් මත කාර්යයන් පැවරීමට කටයුතු කළ යුතුය. |

තබා නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදුලි වැට ඉදිකිරීම සහ එහි නඩත්තුව සඳහා 2021 සහ 2022 වර්ෂ තුළදී පිළිවෙලින් රු.1,251,067,129 ක් හා, රු.1,031,741,420 ක් වැය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට ඉදිකර තිබුණු සම්පූර්ණ විදුලි වැටෙහි දිග ප්‍රමාණය කිලෝමීටර් 4,756 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ, දේපළ හානි හා ශාරීරික හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවූ අතර 2022 වර්ෂයේදී ඒවායේ සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය විය. | සංවර්ධන කටයුතු නිසා අලීන්ගේ වාසභූමි අහිමි වීමෙන් මතුව ඇති මෙම ගැටළුව අවම කිරීම සඳහා විශාල මුදලක් වැය කර විදුලි වැට ඉදිකර නඩත්තු කරනු ලබන අතර වන අලි ගැවසෙන ප්‍රදේශවල හා ඒ අවට ගම්මානවල සිදු කරන ඉඩම් පරිහරණය නිසා වන අලීන් පහර දීමෙන් සිදුවන මිනිස් මරණ වලින් සියයට 50 ක් පමණ ප්‍රතිශතයක් මිනිසුන්ගේ නොසැලිකිලිමත් බවෙන් සිදුවේ. රක්ෂිත ප්‍රදේශ ආසන්නයේ සිදු කරන වගාවන් සඳහා අලින්ගේ ආකර්ශනය හේතුවෙන් හා නිවාස වල වී ගබඩා කිරීම වැනි කරුණු නිසා දේපළ හානි හා ශාරීරික හානි වර්ධනය වී ඇත. | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සුදුසු උපක්‍රමයන් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කිලෝමීටර් 1,500 ක් දිග විදුලි වැට ඉදි කිරීම සඳහා අවශ්‍යවන පෙරසවි බල ශක්ති කුටි 194 ක්, පෙරසවි වැසිකිළි 385 ක්, කොන්ක්‍රීට් කියුබ් 3,080 ක් හා උඩවලව ප්‍රදේශයේ මීටර් 500 කට ඇතිරීම සඳහා වනඅලි සංචරණ බාධක තැටි 6,000 ක් රු.87,308,715 කට දින 90 ක් තුළ සපයා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2021 මාර්තු 15 දින රෙඩෙකෝ ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කර වැඩ මූලික අත්තිකාරම් ලෙස රු.17,461,743 ක් ලබා දී තිබුණ ද, රු.20,607,554 ක වටිනාකමකට ඇණවුම් කළ ප්‍රමාණයෙන් කොටසක් පමණක් සැපයීම හේතුවෙන් වසරකුත් මාස 06 කට වැඩි කාලයක ප්‍රමාදයකින් පසුව 2022 දෙසැම්බර් 30 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. සපයන ලද කොටස් සවිකර අවසන් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | මේ වන විට අත්තිකාරම් බැඳුම්කරය අය කර ගැනීමට ප්‍රමාණවත් සැපයීමක් සිදු කර ඇති බැවින් සපයන ලද භාණ්ඩ සියල්ලම සවි කර අවසන් කළ පසු දැනටමත් ගිවිසුම අවලංගු කර ඇති බැවින් එම කාර්යය නිමකර අවසන් කළ හැකිය. | සපයන ලද භාණ්ඩ සවිකිරීමේ කටයුතු අවසන් කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 2,851 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් තථ්‍ය සේවක සංඛ්‍යාව 1,941 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 946 ක් වූ අතර එයින් 27 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු විය. අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට හෝ පවතින සේවක සංඛ්‍යාව මත කටයුතු පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචන කර අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලද පසු පුරප්පාඩු වී පවතින තනතුරු සඳහා කඩිනමින් බඳවා ගැනීමේ කටයුතු සිදු කළ හැකිය. විද්‍යාත්මක සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කරන ලෙස රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත මේ වන විට ලිපියක් යොමු කර ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |